**ශීර්ෂය 13 - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

---------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවටඅදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවවිසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) මෙම වාර්තාවේ අංක 1.6.3 (අ) සහ අංක 1.6.3 (ආ) දරන ඡේදයන්වල ඇතුලත් නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී ද නිවැරදි කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වා තිබුණු 2019 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු අගයන් හා 2019 අනුමත අයවැය ඇස්තමේන්තු අගයන් එකිනෙකට සමාන නොවුණි. | චක්‍රලේඛ ආකෘතිය ප්‍රකාරව පිළියෙල කළ යුතුවේ. | මුල් ඇස්තමේන්තුවට ලැබුණු අතිරේක ප්‍රතිපාදනද ඇතුලත් කර සඳහන් කර ඇත. |
| (ආ) | චක්‍රලේඛයේ දී ඇති ආකෘතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණු අතර නිවැරදි වටිනාකම්ද සටහන් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ඇ) | 2019 වර්ෂයේ භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශනයන් ඇමුණුම් ලෙස මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශනයන් ඇමුණුම් ලෙස මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

**1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ (ඒසීඒ-එෆ්) අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම්, සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් හා වෙනත් පුනරාවර්තන වියදම් නිවැරදි ලෙස සටහන් කර නොතිබුණි. | කාර්යසාධන ප්‍රකාශයේ වියදම් නිවැරදි ලෙස සටහන් කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

**1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂය තුළ මරදාන රජයේ තාක්ෂණික විද්‍යාලය වෙත පවරන ලද හා අපහරණය කරන ලද අනෙකුත් භාණ්ඩ වල පිරිවැය මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ අපහරණ යටතේ දක්වා නොතිබුණි. | අපහරණය කල වත්කම් වල පිරිවැය මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙන් ඉවත් කළ යුතුය. | අපහරණය කළ වත්කම් 2004 ට පෙර මිලදී ගත් ඒවා වන අතර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත්ව නැත. |
| (ආ) | ආයතනය සතු සියළු වත්කම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අන්තර් ගත කළ යුතු වුවත් ආයතනය විසින් 2004 ජනවාරි01 දිනෙන් පසු අත්පත් කරගත් වත්කම් පමණක් එහි අන්තර් ගත කර තිබුණි. | ආයතනය සතු සියලු වත්කම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අන්තර්ගත කළ යුතුය. | 2004 ට පෙර මිලදී ගත් නමුත් වටිනාකම් නිශ්චිතව තහවුරු කර ගත නොහැකි භාණ්ඩ කිහිපයක් හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී තිබේ. |

**1.6.4 විගණන සාක්ෂි නොවීම**

කාර්යසාධනය ඇගයීම සඳහා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ප්‍රාදේශීය කාර්යාල 10 න්ම තොරතුරු කැඳවා ඇතත් ප්‍රාදේශීය කාර්යාල 04 කින් පමණක් තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

## 1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(i) හානි පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණි. | හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| **(ii) වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගත යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| **(iii) නිවාඩු පිළිබඳ ලේඛනය** | | |
| ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 ප්‍රකාරව නිවාඩු පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | 190 පොදු ආකෘති පත්‍රය ප්‍රකාරව අනුමත කරන ලද නිවාඩු සටහන් කිරීම සඳහා නිවාඩු පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගත යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

## 1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40.1 ඡේදය හා SWISS ව්‍යාපෘතියට අදාලව ශ්‍රී ලංකා මානව හිමිකම් | කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතීම නිසා ගිවිසුමේ අවශ්‍යතාවය අනුව පූර්ණ කාලීන අභ්‍යන්තර විගණනයක් | පුරප්පාඩු තනතුරු පිරවිය යුතුවේ. | මෙම තනතුර පිරවීමට මේ වන විට කටයුතු ආරම්භ කර ඇත. |

| | | | |
|---|---|---|---|
| කොමිෂන් සභාව හා Swiss confederation represented by the federaldepartment of foreign affairs acting through the human security division අතර ඇතිකරගත් ගිවිසුමෙහි XI වගන්තිය | සිදු කිරීමට නොහැකි වී තිබුණි. | | |
| **(ආ)** 1996 **අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත** | | | |
| **-------------------------** | | | |
| (i) 15(8) ඡේදය | නිර්දේශයක් යවනු ලැබූ යම් අධිකාරියක් හෝ තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ,ඒ නිර්දේශයේ සඳහන් කාලය ඇතුළත, කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම පැහැරහැර ඇති අවස්ථාවක හෝ ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාව වෙත වාර්තා කර, කොමිෂන් සභාවේ නිර්දේශ බලාත්මක කිරීම පිණිස ගෙන ඇති හෝ ගැනීමට අදහස් කර ඇති ක්‍රියාමාර්ග කොමිෂන් සභාවේ මතය අනුව ප්‍රමාණවත් නොවන අවස්ථාවක කොමිෂන් සභාව විසින් ඒ කරුණු පිළිබඳව පරිපූර්ණ වාර්තාවක් ජනාධිපතිවරයාවෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව පරිපූර්ණ වාර්තාවක් ජනාධිපතිවරයාවෙත ඉදිරිපත්කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ii) 22(2) වගන්තිය | කොමිෂන් සභාව වෙත පැවරී ඇති කර්තව්‍යය ඉටු කිරීමෙහිලා කොමිෂන් සභාවට සහය වීම පිණිස අවශ්‍ය විය හැකි වෙනත් යම් නිලධරයන් හා සේවකයන් පත්කරනු ලැබිය හැකි වුවත් 2019 ජුලි 31 දින වන විට කොමිෂන් සභාවේ තනතුරුවල පුරප්පාඩු 98 ක් පැවතුණි. | පුරප්පාඩු පිරවිය යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (iii)30වගන්තිය | කොමිෂන් සභාවේ සියළු කටයුතු පිළිබඳ තොරතුරුද, කොමිෂන් සභාව වෙත යොමුකරන ලද සියළු කාරණාවල ලැයිස්තුවක්ද, ඒ කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නිර්දේශද ඇතුළත් කර 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | පනත ප්‍රකාරව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේස භාගත කළ යුතුවේ. | 2016 හා 2017 වාර්ෂික වාර්තා පිළියෙළ කර ඇති අතර 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව පිළියෙල කරමින් පවතී. |
| **(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**<br>--------------------- | | | |
| 2 වැනි කාණ්ඩයේ 13.2 වගන්තිය | සෑම මූලික විමර්ශනයක්ම නොපමාව නිම කිරීමට අදාළ සෑම පාර්ශවයක්ම නිරන්තරයෙන්ම වග බලා ගත යුතු වන්නේය. එහෙත් කොමිෂන් සභාවේ හිටපු ලේකම්වරිය 2018 ජනවාරි 30 දින අනිවාර්ය නිවාඩු යවා ඇතත්, ඇය සම්බන්ධයෙන් මූලික පරීක්ෂණය මාස 21 ක කාලයක් ප්‍රමාද වීම හේතුවෙන් අදාල කාලය තුල එම නිලධාරිනියට රු. 2,467,257 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | මූලික විමර්ශනයන් නොපමාව නිම කිරීමට අදාළ සෑම පාර්ශවයක්ම නිරන්තරයෙන්ම වග බලා ගත යුතුවේ. | මූලික විමර්ශනයේ කටයුතු කොමිෂන් සභාවේ පාලනයෙන් බැහැර හේතුන් නිසාවෙන් ප්‍රමාද වූ අතර පළමු විමර්ශන නිලධාරියා විසින් වාර්තාව ලබා නොදීම හේතුවෙන් නැවත විමර්ශන නිලධාරියෙකු පත් කිරීමට සිදු වූ බැවින් ප්‍රමාද විය. |
| **(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ**<br>---------------------- | | | |
| (i) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කොමිෂන් සභාවේ කර්තව්‍යයන් ලෙස හඳුනාගන්නා ලද කාර්යයන් කාර්යක්ෂමව හා සඵලදායී ලෙස ඉටුකර මහජනතාවට උසස් සේවාවක් සලසා දෙනු පිණිස කොමිෂන් සභාව විසින් වාර්ෂිකව ඉටුකළ යුතු කාර්යයන් හඳුනා ගනිමින් | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | | |
| (ii) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛයේ 3.2.6 ඡේදය | කොමිෂන් සභාව විසින් 2018 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| 3.2.5 ඡේදය | 2018 දෙසැම්බර් 31 දින පැවති භාණ්ඩ සමීක්ෂණය අනුව අපහරණය කිරීමට නිර්දේශ කර තිබූ භාණ්ඩ කිසිවක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| **(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය**<br>---------------------- | | | |
| 2018 ජනවාරි 04 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| **(ඊ) ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**<br>----------------------- | | | |
| (i) 6.3.2, 6.3.3 හා 6.3.6 ඡේද | ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සැමරීම සඳහා අවශ්‍ය සේවාවන් සපයා ගැනීමට, යතුරු පැදියක් මිලදී ගැනීම, හා ඡායා පිටපත් යන්ත්‍ර 05 ක් මිල දී ගැනීමට අදාලව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 13-1-1-2401 වැය විෂයයේ ඉතිරියට හේතුව ලෙස අයවැය චක්‍රලේඛ 04/2019 හා 05/2019 දක්වා තිබුණද කොමිෂන් සභාවේ පුහුණු කිරීම් සඳහා පුහුණු සැලැස්මක් නොමැති වීම ඊට හේතු වී තිබුණි. | පුහුණු සැලැස්මක් සකසා වියදම් කළමනාකරණය කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

## 2.2 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කොමිෂන් සභාවේ නිල බැංකු ගිණුමට අමතරව තවත් බැංකු ගිණුම් 04 ක රු. 771,073ක ශේෂ පැවතුණි. | 2007 සැප්තැම්බර් 05 දිනැති අංක 05/2007 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව නව බැංකු ගිණුම් ක්‍රියාත්මක කිරීමත් සමඟ ඊට සමගාමීව පවතින පැරණි බැංකු ගිණුම් සියල්ල වසා දැමීමට කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. සැලැසුම් කිරීම

ප්‍රාදේශීය කාර්යාල 10 හි මාසික වැඩ සැලසුම් හා මාසික ප්‍රගති වාර්තා ලේකම් වෙත ඉදිරිපත් කිරීම් පිළිබඳ තොරතුරු සාරාංශ කර පහත දක්වා ඇත.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ත්‍රිකුණාමලය හා යාපනය ප්‍රාදේශීය කාර්යාල 2019 වර්ෂයේ කිසිදු මාසයක මාසික වැඩ සැලසුම් හෝ සැලසුම් ප්‍රගති වාර්තා ලේකම් වෙත ඉදිරිපත් කර නොතිබුණි. කල්මුනේ , මඩකලපුව, මහනුවර , බදුල්ල, මාතර, අනුරාධපුර හා වව්නියාව යන කාර්යාල මාසික වැඩ සැලසුම් ලේකම් වෙත නිසි පරිදි ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මහනුවර කාර්යාලය මාස 09 ක් සඳහාත් , මඩකලපුව කාර්යාලය මාස 08 ක් සඳහාත්, මාතර, බදුල්ල හා වව්නියාව යන කාර්යාල මාස 02ක් සඳහාත් , කල්මුණේ හා අම්පාර කාර්යාල එක් මාසයක් සඳහාත් මාසික වැඩ සැලසුම්වලට අදාල ප්‍රගති වාර්තා ලේකම් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රාදේශීය කාර්යාලය විසින් ඉටු කිරීමට බලාපොරොත්තු වන කාර්යයන් ඇතුලත් කරමින් මාසික වැඩ සැලැස්මක් හා එම සැලැස්මෙහි ප්‍රගති වාර්තාව කොමිෂන් සභාවේ ලේකම් වෙත මාසිකව භාර දිය යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

### 3.2 කාර්යසාධනය

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2015,2016,2017 හා 2018 යන වර්ෂ අවසානයට විමර්ශන කටයුතු අවසන් නොවූ ලිපිගොනු සංඛ්‍යාව | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පුරවා පැමිණිලිවලට විසඳුම් ලබා දීම කාර්යක්ෂම කළ යුතුවේ. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීමට ප්‍රධාන හේතුව කොමිෂන් සභාව සඳහා බඳවා ගැනීමේ පරිපාටි අනුමත වී |

| | | | |
|---|---|---|---|
| | පිළිවෙලින් 3576ක් ,5710 ක්,10201 ක් හා 8812ක් වී තිබුණි.මේ සඳහා පැමිණිලි විමර්ශනය කිරීමේ කාර්යය පැවරී ඇති පරීක්ෂණ හා විමර්ශන අංශයට අදාල නීති නිලධාරී 22 න් 21 ක්ද මානව හිමිකම් නිලධාරී තනතුරු 47 සම්පූර්ණයෙන්ද ඇතුළුව පුරප්පාඩු පවතින තනතුරුවල අනුමත තනතුරු 118 න් 98 ක්ම පුරප්පාඩුව පැවතීමත් බලපා තිබුණි.පැමිණිලි වලට විසඳුම් ලබා දීමටද වර්ෂ 2 සිට 6 දක්වා කාලයක් ගත වී තිබුණි. | | නොතිබීම බලපා ඇත. අවසාන වශයෙන් බඳවා ගැනීමේ පරිපාටි 2018 මැයි 17 දින අනුමත වී ඇත.තවද සේවක අන්තර්ග්‍රහණයට අදාළ අවසන් උපදෙස් 2019 අගෝස්තු මාසය වනතෙක්ම ලැබී නොතිබුණු බැවින් බඳවාගැනීම් පරිපාටි ප්‍රකාරව ඉදිරි කටයුතු කළ නොහැකි වී ඇත. |
| (ආ) | කොමිෂන් සභාවේ දිගු කාර්යයකින් පසු ලබා දෙන නිර්දේශද ක්‍රියාත්මක නොවී පැවතුණු අතර කොමිෂන් සභාව විසින් දෙනු ලබන නිර්දේශ අනෙකුත් ආයතන සඳහා බලපාන නීතිරීති සමග නොගැළපෙන අවස්ථා හා සමගාමී පරීක්ෂණ පවත්වන ආයතනවල නිර්දේශ සමග ගැටෙන අවස්ථා පැවතුණි. | නිර්දේශ ක්‍රියාත්මක කරවා ගැනීමට කටයුතු කළ යුතු අතර නිර්දේශ ,අනෙකුත් ආයතන සඳහා බලපාන නීතිරීති හා සමගාමී පරීක්ෂණ පවත්වන ආයතනවල නිර්දේශ සමග ගැටෙන අවස්ථා මඟහරවා ගත යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ඇ) | 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල සීමාව තුල ශ්‍රී ලංකා පොලීසිය වෙත නිර්දේශ 50ක් ලබා දී තිබුණු අතර ඉන් නිර්දේශ 45ක්ද , අධ්‍යාපන අමාත්‍යාංශයට අදාලව නිර්දේශ 90ක් ලබා දී තිබුණු අතර ඉන් නිර්දේශ 36ක්ද , විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අදාලව නිර්දේශ 07ක් ලබා දී තිබූ | කෙටි කාලයකින් නිර්දේශ ලබා දීමටත් එම නිර්දේශ ක්‍රියාත්මක කරවා ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

අතර ඉන් නිර්දේශ 06 ක්ද ක්‍රියාත්මක වී නොතිබුණි. මෙම නිර්දේශ ලබා දීමට මාස 06 ත් වසර 06 ත් අතර කාලයක් ගතව තිබුණි.

## 3.3 විදේශ ආධාර ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| SWISS ව්‍යාපෘතියට අදාල යෝජනාවලියේ සඳහන් අයවැය ඇස්තමේන්තු ප්‍රකාරව බඳවා ගත යුතු "ව්‍යාපෘති සහකාර (Project Assistant)" තනතුර සඳහා නිලධාරියෙකු ව්‍යාපෘති කාල සීමාව අවසන් වන විටත් බඳවාගෙන නොතිබීම නිසා මෙම ව්‍යාපෘතිය හරහා සිදු කරනු ලබන යොවුන් කඳවුරෙහි සම්පූර්ණ කාර්යභාරය කොමිෂන් සභාවේ අධ්‍යාපන හා විමර්ශන අංශය මඟින් සිදු කර තිබුණි. | ව්‍යාපෘති සහකාර (Project Assistant)තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගත යුතුවේ. | ව්‍යාපෘතියට අදාළ ප්‍රතිපාදන ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් වැටුප් ගෙවීමේ ගැටළුවක් ඇති වන බැවින් බඳවාගැනීම් සිදු නොකරන ලදී. |

## 3.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) නේවාසික තරුණ කඳවුර සඳහා ආහාර හා නවාතැන් පහසුකම් සපයා ගැනීම හා අනෙකුත් ප්‍රසම්පාදන කටයුතුවලදී නිසි ප්‍රසම්පාදන ක්‍රමවේද අනුව කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදනයට අදාල සියළු විස්තර ලිපි ගොනුවෙහි ඇතුලත් කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි.ප්‍රසම්පාදන කමිටුවක් පත් කර නොමැති අතර කොමසාරිස් මණ්ඩලය වෙත යොමුකර මාණ්ඩලික පත්‍රිකාවක් මඟින් අනුමැතිය ලබාගෙන ඇති බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ආ) | මහනුවර ප්‍රාදේශීය කාර්යාලය විසින් වානේ අල්මාරි මිලදී ගැනීමට මිල ගණන් කැඳවීමේදී ප්‍රධාන කාර්යාලය විසින් ලබා දෙන ලද පිරිවිතර අනුව තහඩුවේ ඝණකම 0.6 ක් විය යුතු වුවද ඇගයීම් කිරීමේදී ඝනකම 0.4 ක් සහිත තහඩුවකින් යුතු Office Cupboard 3 ක් හා 4 Drawer Cupboard 1 ක් මිලදී ගෙන තිබුණි. | මිලදී ගන්නා භාණ්ඩ තාක්ෂණික පිරිවිතර වලට අනුකූල විය යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාවට දෙවන අවම මිල ඉදිරිපත් කළ ආයතනයෙන් ඡායා පිටපත් යන්ත්‍ර මිල දී ගැනීමට හැකියාව පැවතියද සති දෙකක් භාණ්ඩ සැපයීම ප්‍රමාද වීම සලකා එම ආයතනයෙන් මිල දී ගැනීම ප්‍රතික්ෂේප කර තෙවන අවම මිල ඉදිරිපත් කළ ආයතනයෙන් රු.7,000 බැගින් වැඩිපුර ගෙවා ඡායා පිටපත් යන්ත්‍ර 05ක් 2019 වර්ෂයේදි මිලදී ගෙන තිබුණි. ඉන් යන්ත්‍ර 2ක් 2020 මැයි මස වන තුරුත් මාස 05කට අධික කාලයක් භාවිතයට ගෙන නොතිබුණි. | අවශ්‍යතාව නිසි පරිදි හඳුනාගෙන මිලදී ගත යුතුවේ. | එම ඡායා පිටපත් යන්ත්‍ර බෙදා දිය යුතු 4 වැනි මහලේ හා පුත්තලම කාර්යාලයේ අභ්‍යන්තර ගැටළු කිහිපයක් හේතුවෙන් බෙදා හැරීම ප්‍රමාද විය. |

| | | |
|---|---|---|
| (ආ) කොමිෂන් සභාව සතු ත්‍රීරෝද රථය 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ඌණ උපයෝජිතව පැවතුණි. | ඌණ උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැලැස්මේද පනතේ දුර්වලතා සඳහන් කර ඇතත් 1996 වර්ෂයේ සිට පනත සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පනත සංශෝධන කිරීමට කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ආයතනයේ අධ්‍යක්ෂ තනතුරු 05ක් අනුමතව පැවති නමුත් එම තනතුරු 05ම හා සහකාර අධ්‍යක්ෂ තනතුරු 03 ම පුරප්පාඩුව පැවතුණි. තවද විධායක ශ්‍රේණියේ තනතුරු 46ක් අනුමතව පැවතියද ඉන් 34ක් පුරප්පාඩුව පැවතුණි. මෙලෙස විධායක ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩුව පැවතීම හේතුවෙන් ආයතනයේ පාලන කටයුතු විධිමත්ව පවත්වාගෙන යෑම හා සංවිධාන ව්‍යුහය විධිමත්ව පවත්වා ගැනීම ගැටළු සහගත විය හැකි බව නිරීක්ෂණය විය. | අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පිරවිය යුතුවේ. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීමට ප්‍රධාන හේතුව කොමිෂන් සභාව සඳහා බඳවාගැනීමේ පරිපාටි අනුමත වී නොතිබීම බලපා ඇත. අවසාන වශයෙන් බඳවාගැනීමේ පරිපාටි 2018 මැයි 17 දින අනුමත වී ඇත. තවද සේවක අන්තර්ග්‍රහණයට අදාළ අවසන් උපදෙස් 2019 අගෝස්තු මාසය වනතෙක්ම ලැබී නොතිබුණු බැවින් බඳවාගැනීම් පරිපාටි ප්‍රකාරව ඉදිරි කටයුතු කළ නොහැකි විය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොමිෂන් සභාවේ මානව හිමිකම් නිලධාරී තනතුරු 47ක් අනුමත වී තිබුණද එම තනතුරු පිරවීමට කටයුතු කර නොතිබුණි. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවිය යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ඇ) | අධ්‍යක්ෂ තනතුරු සඳහා වෙනත් සුදුසුකම් සමඟ කළමනාකරණ මට්ටමේ වසර 15ක සේවා පළපුරුද්දක් ඇති නිලධාරීන් අයදුම්කර නොමැති වීමෙන් එම පුරප්පාඩු පිරවීමට නොහැකි වී තිබුණි. | බඳවා ගැනීමේ පරිපාටියට අයදුම් කළ හැකි සේවා පළපුරුද්දක් ඇතුලත් කළ යුතුවේ. | වසර 15ක සේවා පළපුරුද්දක් ඇති නිලධාරීන් ඉල්ලුම් කර නොතිබුණු බැවින් පුරප්පාඩු පිරවීමට නොහැකි විය. |